# දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය පේරාදෙණිය විශ්වවිද්‍යාලය
# தொடர் தொலைக் கல்வி நிலையம் பேராதனைப் பல்கலைக்கழகம
# CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION UNIVERSITY OF PERADENIYA

First Year (100 Level) Examination in Bachelor of Arts (External New Syllabus) April 2017

## (ECNE 102) – (තුලනාත්මක ආර්ථික සංවර්ධනය)

**උපදෙස්**

- එක් කොටසකින් අඩු තරමින් ප්‍රශ්න දෙකක්වත් තෝරා ගෙන ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න
- මෙම ප්‍රශ්න පත්‍රයේ අඩංගු ප්‍රශ්න සංඛ්‍යාව 10 කි
- එක් එක් ප්‍රශ්නය සඳහා ලකුණු ලබාදීම පෙන්නුම් කර ඇති පරිදිවේ
- කාලය - පැය තුනයි

---

### I වන කොටස- එක්සත් රාජධානිය

1. (i) මහා බ්‍රිතාන්‍යයේ වැඩවසම් ක්‍රමයෙහි ප්‍රධාන ආර්ථික අංග ලක්‍ෂණ විස්තර කරන්න. (ලකුණු 10)
   (ii) එහි බිඳවැටීමේ ක්‍රියාවලිය සඳහා දායකවූ සාදක විශ්ලේෂණය කරන්න (ලකුණු 10)

2. 18 වන ශතවර්ෂයේ සහ 19 වන ශතවර්ෂයේ මුල් අවධියේදී බ්‍රිතාන්‍ය කෘෂිකාර්මික ක්‍රමවල වෙනස්කම් ඇතිකලේ කුමන ආකාරවලින්ද? ඒවා කෘෂිකර්මාන්තය මත ඇතිකල ප්‍රතිඵල මොනවාද? (ලකුණු 20)

3. (i) 18 වන ශතවර්ෂයේ බ්‍රිතාන්‍ය කපු කර්මාන්තයේ ඇතිවූ තාක්‍ෂණික ප්‍රගතිය කෙටියෙන් දක්වන්න. (ලකුණු 10)
   (ii) මහා බ්‍රිතාන්‍ය කාර්මික විප්ලවයේ දෙවන අදියර පළමු අදියරයෙන් වෙන්කොට දක්වන්නේ කෙසේද? (ලකුණු 10)

4. 1830 න් පසු කාලසීමාව තුල මහා බ්‍රිතාන්‍ය දුම්රිය ප්‍රවාහනයෙහි ආර්ථික සහ සමාජ ප්‍රතිවිපාක සාකච්ජා කරන්න. (ලකුණු 20)

5. මහා බ්‍රිතාන්‍යය පිළිබඳව පහත ඒවායින් ඕනෑම **හතරක්** පිළිබඳව කෙටි සටහන් ලියන්න

   (i) කොටු කිරීමේ ව්‍යාපාරයන්
   (ii) වර්ෂ 1815 ධාන්‍ය නීති
   (iii) 1825-1870 අතර කාලය තුල වෘතීය සමිති
   (iv) චාටිස්ට් ව්‍යාපාරය
   (v) කර්මාන්ත ශාලා පනත් (Factory Acts)

   (04 X 05=20) (ලකුණු 20)

## II වන කොටස- ශ්‍රී ලංකාව

6. ශ්‍රී ලංකාවේ කෝල්බෲක් කැමරන් ප්‍රතිසංස්කරණ යෝජනාවල ස්වභාවය, ප්‍රතිවිපාක සහ වැදගත්කම පිළිබඳව විවේචනාත්මකව විභාග කරන්න. (ලකුණු 20)

7. 19 වන ශතවර්ෂයේ ශ්‍රී ලංකාවේ කෝපි වගාවෙහි සීඝ්‍ර වර්ධනයට සහ ක්ෂණික කඩා වැටීමකට හේතුවූ සාධක හඳුනාගෙන ඒවා විස්තර කරන්න. (ලකුණු 20)

8. 19 වන ශතවර්ෂයේ අගභාගයේදී සහ 20 වන ශතවර්ෂයේ මුල් භාගයේදී ශ්‍රී ලංකා ආර්ථිකයෙහි ද්විත්ව ලක්ෂණ පැවතීම සඳහා වන හේතු විශ්ලේෂණය කරන්න (ලකුණු 20)

9. කන්ද උඩරට සිංහලයන් 19 වන ශතවර්ෂයේදී වැවිලි අංශයේ වැටුප් ලබන රැකියාවල නියුතුවීමට අකමැතිවූ හේතු විභාග කරන්න (ලකුණු 20)

10. ශ්‍රී ලංකාව පිළිබඳව පහත ඒවායින් ඕනෑම **හතරක්** පිළිබඳව කෙටි සටහන් ලියන්න

(i) 'රාජකාරිය' අහෝසි කිරීම
(ii) කිරීට ඉඩම් පනත
(iii) 1802-1833 අතර කාලය තුල කුරුඳු වෙළඳාම
(iv) 1884-1896 අතර කාලය තුල තේ කර්මාන්තය
(v) මුදල් මණ්ඩල ක්‍රමය

(04 X 05=20) (ලකුණු 20)

**********************